## සංක්ෂිප්තය


කළමනාකරණ කාර්යයක් මෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය ද උදෙසා ක්‍රියාත්මකවන අභ්‍යන්තර ගුරු අධීක්ෂණය ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ උන්නතියට ඉවහල්වන වැදගත් යාන්ත්‍රණයකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යංශය, චක්‍රලේඛ මගින් අභ්‍යන්තර ගුරු අධීක්ෂණය ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලිකර ඇත. ශිෂ්‍ය සාධනය නැංවීම හා ගුරු සංවර්ධනය එහි ප්‍රධාන අපේක්ෂණ වේ . නමුත් ක්‍රියාත්මක වීමේදී විවිධ අඩුපාඩු සහ පාසල් වර්ගය අනුව විෂමතා ඇති බව පෙනී යයි. එම නිසා මෙම පර්යේෂණය පාසල්වල අභ්‍යන්තර ගුරු අධීක්ෂණයේ වර්තමාන ස්වභාවය අධ්‍යයනය කිරීම සඳහා ක්‍රියාත්මක විය.

පාසල්වල වර්තමාන අභ්‍යන්තර ගුරු අධීක්ෂණයේ ස්වභාවය හා ඉන් සිදුවන ගුරු සංවර්ධනය හඳුනා ගැනීමත් අභ්‍යන්තර ගුරු අධීක්ෂණය පිළිබඳ එයට සහභාගි වන්නන්ගේ ආකල්ප පරීක්ෂාකර ගුරු අධීක්ෂණ වැඩ පිළිවෙල දියුණු කිරීමට ඔවුන්ගේ අදහස් මත යෝජනා ඉදිරිපත් කිරීමත් අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය.

මෙහිදී විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයෙහි නියදි සමීක්ෂණ ප්‍රවේශය යටතේ ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ ලේඛන සමීක්ෂණ මගින් ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් 10ක අභ්‍යන්තර අධීක්ෂකවරුන් 57 දෙනෙකුගෙන් සහ ගුරුවරුන් 74 දෙනෙකුගෙන් ලබා ගත් දත්ත සරල සංඛ්‍යාන ක්‍රම ඇසුරින් විශ්ලේෂණය සහ අර්ථකථනය කරනු ලැබීය.

අභ්‍යන්තර ගුරු අධීක්ෂණය සුහදව සිදුවන බවත් අධීක්ෂකවරුන් වෘත්තීය සුදුසුකම් හා ඉහළ අධ්‍යාපන සුදුසුකම්වලින් යුක්ත වූවන් බවත් අධ්‍යයනයෙන් අනාවරණය විය.

අධ්‍යාපනික අධීක්ෂණය පිළිබඳ න්‍යායික සාහිත්‍යයේ පදනම මත තොරතුරු විමර්ශනයේ දී වර්තමානයේ පාසල්වල ගුරු අධීක්ෂණ සැලසුම් සහගතව අඛණ්ඩව සිදු නොවීම, ඒ පිළිබඳ විදුහල්පතිගේ නියාමන අවම වීම, අධීක්ෂණ සාකච්ඡා ක්‍රමවත් නොවීම, වාචික උපදෙස්වලට ගුරු සංවර්ධනය සීමා වීම අධ්‍යයනයෙන් අනාවරණය වූ අතර ඇතැම් කරුණුවලට සමගාමී අනාවරණ ද අධ්‍යයන සාහිත්‍යය තුළ දක්නට ලැබිනි. පෞද්ගලික පාසල්වල ගුරු අධීක්ෂණ අවශ්‍යතා අවම වුවත් සිසු, දෙමාපිය තොරතුරු මත ඇතැම්විට වක්‍රව අධීක්ෂණ සිදු වීමත්, සාර්ථක ගුරුවරුන්ට පාසලේ තනතුරු ලබා දීමත් රජයේ පාසල්වලට ආදර්ශයන් වනු ඇත.

අභ්‍යන්තර ගුරු අධීක්ෂණ පිළිබඳ ගුරුවරුන්ට සාපේක්ෂව අධීක්ෂකවරුන්ගේ ධනාත්මක ආකල්ප බහුල බවත් විද්‍යමාන විය. අධීක්ෂකවරුන්ගේ ආකල්ප පාසල් වර්ගය අනුව වෙනස් නොවුනත් 1C රජයේ පාසල්වල ගුරුවරුන්ගේ ඍණාත්මක ආකල්ප බහුල විය. සමානයින් මගින් අධීක්ෂණය වඩා සුදුසු ක්‍රමයක් බව අධීක්ෂක හා ගුරු පිරිසේ ප්‍රබල අදහසක් ලෙස ඉදිරිපත් විය.

. ඒ අනුව පාසල්වල අභ්‍යන්තර ගුරු අධීක්ෂණය සැලසුම් සහගතව සංවිධානය කිරීම, අධ්‍යාපනික ක්ෂේත්‍රයේ අදාළ ආයතන මගින් අධීක්ෂකවරුන්ගේ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම, මගින් අභ්‍යන්තර ගුරු අධීක්ෂණයෙන් නිසි ඵල ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

## English Abstract

The internal supervision which is being carried out in schools today for the betterment of school management and teaching-learning process is an important mechanism for the development of teaching in schools in Sri Lanka. The circulars issued by the ministry of education in Sri Lanka have explained the nature of its implementation. The goals are to uplift students' progress and teacher development. It has been found that the internal supervision of Teachers has different shortcomings and differences according to the school type. Therefore, this research has been implemented to get a clear understanding of the internal supervision of teachers in Sri Lanka.

The main objectives of the study are to understand the internal supervision of teachers in school and present suggestions for the development of internal supervision by examining teacher attitudes on that.

The data are analyzed and interpreted by using simple statistics under the sample survey approach of descriptive research through questionnaires, interviews, and documental surveys taken from 57 supervisors and 74 teachers in ten schools of Gampaha district.

It is understood that internal supervision of teachers occurs peacefully and the supervisors are highly educated and professionally qualified personal. When reviewing information on internal supervision supported by theoretical literature on it, proper teacher supervision does not take due to several reasons that reduce the smooth functioning of such supervision. Poor regulation and monitoring by school administration, lack of proper supervision discussions, as well as lip service teacher supervision have been pointed as the main drawbacks in internal teacher supervision.

The private schools can be taken as good examples for the government schools as the teacher supervision is done indirectly through parents' and students' information. Although the supervisors have rich positive attitudes, teachers have poor positive attitudes on internal teacher supervision. The supervisors and teachers have a great idea that peer supervision is most suitable.

Finally, this study shows that proper results for internal teacher supervision could be obtained through systematic planning of internal supervision of teachers and provision of proper training courses for the supervision by the Government.